# - <u>සද්ධර්මරත්නාවලිය</u> -

සද්ධර්මරත්නාවලියේ කර්තෘ 'ධර්මසේන' නම් වූ බෞද්ධ භික්ෂූන් වහන්සේ නමකි. උන් වහන්සේ රචනා කළ මෙකී කෘතියේ මුද්‍රිත පිටු ගණනින් 1032කි. මේ ග්‍රන්ථය ද 'පූජාවලී' ග්‍රන්ථය හා සමකාලීන තත්වයට පැමිණෙයි.

ධර්මසේන හිමියන්ගේ නාමමාත්‍රය විනා උන් වහන්සේගේ පෞද්ගලික ජීවිතය, උන් වහන්සේ කවර විහාරයක විසුයේ ද? කවර නිකායක් ගුරු කළේ ද? ගුරුවරු කවු ද? යනාදි මොන යම් තොරතුරක් පිළිබඳ වත් මෙතෙක් අනාවරණයට ලක් වූ පොතපතින් හෝ වෙනත් කිසිදු සාහිත්‍ය මූලාශ්‍රයකින් හෝ හමු නො වීම තුළින් මෙවැනි මාහැඟි ගත්කතුවරයෙකු පිළිබඳ ව අධ්‍යයනයට ඇති ඉඩහසර සීමා වී පැවතීම අභාග්‍යයකි.

ධර්මසේන හිමියන් විසින් රචනා කෙරුණු එක ම කෘතිය වශයෙන් සැලකෙන සද්ධර්මරත්නාවලියෙහි උන්වහන්සේගේ නාමය මෙසේ සඳහන් වෙයිඃ

**'සද්ධම්මට්ඨිති මිච්ඡන්තො**

**ධම්මසේන යතිස්සරො**

**අකාසි පවරං එතං**

**සද්ධම්මරත්නාවලිං'**

සද්ධර්මයෙහි චිර පැවැත්ම කැමති වන ධර්මසේන නායක ස්වාමීන් වහන්සේ මේ උතුම් සද්ධර්මරත්නාවලිය ලියූ හ. නිකාය සංග්‍රහයෙහි පැනෙන 'ධර්මසේන' නාමයෙන් හඳුන්වනු ලබන්නේත් මේ ගාථාවෙහි දැක්වෙන 'ධර්මසේන' ස්වාමිපාදයන් දැයි යන සැකය නිසා මෙහි කර්තෘ අනුමාන වශයෙන් පූජාවලී කෘතිය කළ මයූරපාද පරිවේණාධිපතීන් හා සමකාලීන කොට සැලකිය හැකි ය.

කෘතිය පූර්වයේ දී මෙන් ම අවසානයේ දී ද උන් වහන්සේගේ කර්තෘත්වය මෙලෙස සනිටුහන් වෙයිඃ

**'ධම්මසෙස නවනොථවා යසවතො**

**- ධම්මෙන ධම්ම දධ්ජො**

**පණ්ණින්දුජ්ජති ධම්මසෙන ඉති යො**

**- ථෙරො මහා විසසුතො**

**තෙජං සො සුචිරං තිපෙටකධරො**

**- සාධුහි සම්භාවිතො**

**යෙනෙසා රත්නාවලී විරචිතො**

**- සද්ධම්ම වංසුබ්භවා'**

ඉහත පිළිවෙළ අනුව ධර්මසේන හිමියන් මයූරපාද හිමියන්ගේ සමකාලීනයෙකු නම් උන් වහන්සේ ක්‍රි. ව. 1236 - 1371 තෙක් වසර 35 ඇතුළත සද්ධර්මරත්නාවලිය රචනා කරන්නට ඇත. මේ නිසා උන් වහන්සේ විසූ කාලය අනුමාන වශයෙන් අපට සිතිය හැකි ය.

පැරණි සාහිත්‍යධරයන් බොහෝ දෙනෙක් අනුගත වී සිටියේ යම් ප්‍රභූවරයෙකුගේ ඇරයුම මත ග්‍රන්ථ ලිවීමේ සම්ප්‍රදායට යි. පූජාවලිය දේව ප්‍රතිරාජ නම් අමාත්‍යයෙකුගේ ආරාධනාව පිට ලියැවුණකි. පන්සිය පනස් ජාතකය වීරසිංහ ප්‍රතිරාජ ඇමතිඳුගේ ආරාධනාව මත ලියැවුණි. සිදත්සඟරාව ද දේව ප්‍රතිරාජ ඇමතිඳුගේ ම ඇරයුම පිට රචනා විණි. මෙකී සම්ප්‍රදාය බිඳ හෙළමින් කිසිවෙකුගේ ඇරයුමක් හෝ අයැදීමක් හෝ කිසිවෙකු සතුටු කිරීමට තම ග්‍රන්ථය උපයුක්ත කොට නො ගැනීම සාහිත්‍යමය ලක්ෂණයකටත් වඩා උන් වහන්සේ තුළ වූ පෞද්ගලික ගුණාංගයක් වන ස්වාධීනත්වය, නිවහල් නිදහස් ලේඛකත්වය ඉස්මතු කරයි.

සැබැවින් ම උන් වහන්සේ සද්ධර්මරත්නාවලිය රචනා කරන ලද්දේ හුදී ජනතාවට, පින්කම්හි හැසිර ලොවී ලොවුතුරා සැපත් සිද්ධ කිරීමට ය; නුවණ ම පිහිට කොටගැනීමට ය; මාර්ග ඥාන නමැති කඩු ගෙන කෙලෙස් සතුරන් හා සටනට ම නියැලී හිඳීමට ය; නිවන් මහ මුහුදින් ඵල සමවත් රුවන් ලැබීමට ය; හුදී ජනයා මෙලොව, පරලොව දෙලොව වශයෙන් සතුටු කරවීමට ය.

ධර්මසේන හිමියන් ජන ජීවිතය පිළිබඳ බොහෝ අද්දැකීම්වලින් පරිපූර්ණ වූවෙකු වූ අතර පොදු ජන වේදනා කෙරෙහි සානුකම්පිත දෘෂ්ටියක් හෙළුවෙකි.

සද්ධර්මරත්නාවලියේ එන සැම කථාවස්තුවකින් ම ප්‍රතීයමාන මෙම ලක්ෂණය පටාචාරා වහන්දෑගේ වස්තුවෙන් වඩාත් ම හොඳින් ඉදිරිපත් කෙරෙයි:

**'සිටුදුවණියෝ ද මහත් දුක් විඳිමින් දඬු කපා ගිය තැනැත්තවුන් නගන ගෙවල් තබා උන් තමනුත් නො ලැබ අනෙක් පුතණු කෙනෙකුන් වදාපූ ය'**

*(පටාචාරා වහන්දෑගේ වස්තුව)*

ධර්මසේන හිමියන් ත්‍රිපිටක ධර්මයන්හි කෙළ පැමිණියෙකු මෙන් ම නා නා විධ ගර්හිත හා ගර්හිත නො වූ විද්‍යාවන් පිළිබඳ අක්මුල් විහිදුණු ගැඹුරු දැනුමක් ඇත්තෙකු වග කථාවස්තු තුළින් වටහා ගැනීම අපහසු නො වේ.

ව්‍යුත්පත්තික ඥාන දර්ශනයෙන් මතු නො ව සාමාන්‍ය ජනයාගේ නිරන්තර ආශ්‍රය ඔස්සේ පෘථුල ඥාන කෝෂයකින් සමෘද්ධ වූ උන් වහන්සේ කෘතිය සිදු කළේ හැකිතාක් දුරට සාමාන්‍ය ගැමි ජනතාවගේ මෙලොව පරලොව සුබසිද්ධිය පිණිස ම ය:

**'තව ද පින් ඇත්තවුන්ටත් අවසර ලත් අකුශලයාගේ වශයෙන් වන ආපද් දක්වනු නිසා පටාචාරා වහන්දෑගේ වස්තුව කියමු.'**

*(පටාචාරා වහන්දෑගේ වස්තුව)*

මිනිස්සිත ක්‍රියා කරන ආකාරය පිළිබඳ ව ධර්මසේන හිමියන් තුළ ඇත්තේ තියුණු ඉවකි. ඊට අවැසි පන්නරය භික්ෂු ජීවිතයෙන් මෙන් ම ස්වකීය පරිණත චරිත ලක්ෂණ තුළින් ද උන් වහන්සේට ලැබී තිබේ.

පුහුදුන් මිනිසාගේ අතැම් දුර්වල තැන් දැක සමහර ධර්ම දේශකයන් මෙන් නො කිපුණු දම්සෙන් හිමියෝ ඒ සියල්ල උපේක්ෂා බරිත ව විඳ දරා ගත්හ. උන් වහන්සේගේ අනුකම්පාවට වඩාත් ලක් වූයේ සුමඟට පිළිපන්නවුන් නො ව දුශ්චරිතයෙහි හැසිරෙන්නවුන් ය. නො මඟ ගියවුන් දෙහි ලෙල්ලක් මෙන් පාගා දැමූ බොහෝ සුචරිතවාදීන් අතර ධර්මසේන හිමි නමැති සුචරිතවාදියාගේ දර්ශනයෙන් ඔවුනට හිමි වූයේ සුමඟට ඒමට මහා පිටිබලයකි.

ගෘහ ජීවිතයෙන් මිදුණු භික්ෂූන් වහන්සේ නමක් වතුදු උන් වහන්සේ මිනිසුන්ගේ යුග ජීවිතයේ උරුමකරුම හොඳින් හඳුනන්නා සේ යඃ

**'පරමන් පිසමන් ආදිය කෙරෙමින් තමන් යට කළ අකුශලයෙහි අනිෂ්ට විපාකය වී බත් කමින් සිට හමු බතකුත් කන්නා සේ අනුභව කරන්ට පටන් ගත්හ.'**

**(පටාචාරා වහන්දෑගේ වස්තුව)**

ගොවිතැන, වෙළහෙළඳාම මෙන් ම වෙදකම ගැන ද උන් වහන්සේ සතු වූ දැනුම සද්ධර්මරත්නාවලියෙන් හෙළි වෙයිඃ

**'ඔබ වැලිත් ගොයම් කළමනාවක තබා පියා කල් පසුකොට කරන ගොයමක් සේ'**

**'වණයෙක කෂාරෝදකයක් වත් කළ කලක් මෙන්'**

**'විරේචනයෙන් දුර්වල වූ ශරීරයක් ස්නේහ පානයෙන් සතපන්නා සේ'**

**'තිබී බලවත් වන ලෙඩක් බෙහෙදක් දී සන්සිඳුවන කලක් මෙන්'**

**'රෝග කර නියාව දැන, දන්නා පිළියමුත් නො කරන්ට සිතන වෙදවරුන් සේ'**

මේ නිසා උන් වහන්සේ ළමා කාලයේ පැවිදි වූවෙකු නො ව ජීවිතය පිළිබඳ ව මනා අවබෝධයක් ලද පසු පැවිදි දිවියට එළැඹුණු හිමිනමක් බව අනුමාන කළ හැකි ය.

'ධර්මසේන ස්ථවිරයන් ගුරුළුගෝමීන් බඳු සූක්ෂ්ම බුද්ධියෙන් යුක්ත තාර්කිකයෙකු නො ව ලොවෙහි ජඩ පක්ෂය වුව උපේක්ෂාවෙන් ද, හොඳ පැත්ත සිනාවෙන් හා විනෝදයෙන් ද සැලකූ සෙම් වැඩි තරබාරු දේහයකින් යුතු වෘද්ධතර බහුශ්‍රැතයෙක් වූ හ' යි මාර්ටින් වික්‍රමසිංහ මහතා අනුමාන කරයි.

ධර්මසේන හිමියන් පිළිබඳ ව තොරතුරු තථ්‍ය වශයෙන් ම පැනෙන මූලාශ්‍රයක් නැතත් උන්වහන්සේගේ ජීවිතය පිළිබඳව බොහෝ තතු සද්ධර්මරත්නාවලිය කෘතිය ඇසුරින් ම හෙළි කරගත හැකි ය.

ධර්මසේන හිමියන් සද්ධර්මරත්නාවලිය රචනා කළේ ධම්මපදට්ඨ කථාව ඇසුරිනි.

ධම්මපදට්ඨ කථාව යනු ධම්මපද ගාථාවන්හි අර්ථකථනයයන් සඳහා විරචිත පාළි කෘතියකි. ධම්මපදයට සේ ම ධම්මපදට්ඨ කථාවට ද මෙරට වියතුන්ගේ සම්භාවනාව, පැසසුම, කීර්තිය නො අඩු ව ලැබුණි.

එකී ගුණකඳ නො වියත් හුදී දනන්ගේ පහන් සංවේගය උදෙසා යොමු කිරීමේ යුතුකමට සද්ධර්මරත්නාවලී කෘතිය හරහා කතුවරයා උර දරයි. එනම් සද්ධර්මරත්නාවලිය රචනා කිරීම සඳහා උන් වහන්සේ ධම්මපදට්ඨ කථාවේ ආභාසය ලබා ඇති බව යි.

ධම්මපදට්ඨ කථාව ගුරු කොටගත්ත ද සද්ධර්මරත්නාවලිය එහි අනුපිටපතක් නො වන වග කතුවරයා ඍජු ව ම ප්‍රකාශ කරයිඃ

**'පාළි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන අප විසින් කළා වූ ප්‍රබන්ධයෙහි..'**

සද්ධර්මරත්නාවලිය රචනා කිරීමේ දී කතුවරයා සමස්තයක් වශයෙන් එකක් නැර කථා පුවත් ධම්මපදට්ඨ කථාවෙන් නො ගනී. ස්වකීය අවශ්‍යතා අනුව කතුවරයා ධම්මපදට්ඨ

කථාවෙන් අත් හළ යුතු තැන් අත් හරියි. අමුතුවෙන් එක් කළ යුතු තැන් එක් කරයි. ඒ අනුව ධම්මපදට්ඨ කථාවේ එන පදගත විස්තර ආදි කොටස් කතුවරයා බැහැර කරයි. මිලින්ද ප්‍රශ්නයේ බාහිර කථාව ඇසුරින් නාගසේන කථාව, දික්සඟ අටුවාව ඇසුරින් බරණැස් රජුගේ කථාව, සුත්තනිපාත අටුවාව ඇසුරින් කාෂ්ඨවාහන රජුගේ කථාව හා සාතාගිරි හෙමවත දෙනාගේ වස්තුව, බුද්ධවංස පාලිය හා අටුවාව ඇසුරින් සූවිසි විවරණය කථා හා බුද්ධ චරිතය, මංගල සූත්‍ර අටුවා ආදි වූ කථා ආදිය මඟින් හෙළි වන්නේ බැහැරින් දේ ගෙන කෘතිය රචනා කිරීමට කතුවරයා පෙලඹුණු සැටි ය.

සද්ධර්මරත්නාවලිය ඔස්සේ පළමු වරට සිංහල කථාවස්තු ක්‍රමයක් සාහිත්‍යයට හඳුන්වා දෙන ධර්මසේන ස්ථවිරයෝ එහි නවතම හැරුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කරති. අනුරපුර යුගයේ රචිත සිහල වත්ථුව, සහස්ස වත්ථුව හා රසවාහිනිය වැනි කෘතිවලින් පාළි බණකථා කලාවක් හඳුන්වාදී තිබුණ ද එය සිංහල කතා කලාවක් හඳුන්වා දී තිබුණ ද එය සිංහල කතා කලාවක් බවට පත් වූයේ පොලොන්නරු යුගයේ දී ය.

මේ යුගයේ රචිත බුත්සරණ, අමාවතුර, ධර්මප්‍රදීපිකාව, දහම් සරණ හා සඟ සරණ යන ග්‍රන්ථවලින් ගොඩ නැගූ ඒ කථා කලාව යි. දඹදෙණි යුගයේ දී සද්ධර්මරත්නාවලිය තුළින් තව දුරටත් පොදු ජනකතා කලාවක් බිහි විය.

සද්ධර්මරත්නාවලිය රස විඳීම මඟින් ධර්මසේන හිමිගේ කථා කලාව අගය කිරීමට හේතු වන ප්‍රධාන කරුණු දෙකක් පැන නඟී.

1. සාමාන්‍ය පොදු ජනයා සඳහා ලියන ලද්දක් වීම.
2. 'ධර්මාභියෝගයට උපදෙස්' දෙනු පිණිස කථා වස්තු පාළි සාහිත්‍යයෙන් ගැනීමට සිදුවීම.

පොදු ජනතාව ඉලක්ක කළෙන් ඔවුනට වැටහෙන පරිදිත්, ඔවුන් තුළ හැඟීම් දනීම් තීව්‍ර වන පරිදිත් සරල භාෂාවක් උපයුක්ත කොටගැනීමට ධර්මසේන ස්වාමිපාදයාණෝ උත්සුක වූහ. ඒවාට ම අනන්‍ය උපමා, රූපක ද ගැමි ජීවිත අනුසෙරෙන් ම යොදා ගත්හ.

පහත උපුටනයෙන් ඒ බව මනා ව තහවුරු කරයි:

**'තවද මාලුවා ලිය වැලඳි ගස්කොළවල වැඩියුරුවක් නැත්තා සේ තද මසුරුසිත් ඇත්තවුන් පිනට නො ලැගෙන නියාව හඟවනු පිණිස...'**

*(මච්ඡරිය කෝසිය සිටාණන්ගේ වස්තුව)*

ඕනෑ ම කථාවක කතාරසය කුළු ගැන්වීමේ දී මෙන් ම විචාරයට පාත්‍ර වීමේ දී ද වඩා වැඩි වපසරියක සංවාදයක් විවෘත වන්නේ චරිත නිරූපණය කර ඇති ආකාරය වටා ය. චරිත නිරූපණයෙහි මෙන් ම ඊට අනුරූප අයුරින් වස්තු විකාශනය කිරීමේ සමත්කම චූලතිස්ස තෙරුන් වහන්සේගේ, මච්ඡරිය කෝසිය සිටුතුමාගේ, පටාචාරාවගේ සිත හරහා වඩාත් හොඳින් ප්‍රතීයමාන වෙයි. සැම චරිතයකට ම පොදුවේ සානුකම්පිත දෘෂ්ටියක් හෙළීම ධර්මසේන හිමියන්ගේ කතා කලාවේ පොදු ලක්ෂණයක් බවට පත් ව ඇත්තේ නිරායාසයෙනි:

**'සිටුදුවණියෝ ද දරුවන් දෙන්නා බඩතුරෙහි ලාගෙන දෙදණත් දෙවැලමිටත් ඔබාලා නැබුරුව ගෙන තුන්යම් රාත්‍රිය ගෙවාපීහ.'**

*(පටාචාරා වහන්දෑගේ වස්තුව)*

ධර්මසේන හිමියන් වනාහි සුසිල්වත් බෞද්ධ භික්ෂුවකි. කෙතරම් ප්‍රතිභාව පූර්ණ ව ජනමන රැඳෙන පරිදි කෘතිය රචනා කළ උන් වහන්සේ ඒ සියල්ල සිදු කළේ නුවණ මඳවත් කුසලච්ඡන්දය ඇතිවුන්ට නිවන් සාදාගැනීම පිණිස ය. එනම් භික්ෂුත්වයට, භික්ෂු කාර්යයට, භික්ෂූන් වහන්සේගේ සමාජ වගකීම් පටිපාටියට අනුගත ව ය. එය වඩාත් කුළු ගැන්වෙන්නේ ධර්මසේන හිමියන් කෘතිය තුළ ධර්මකථිකයෙකු වන කල ය. බණකථා රීතිය අනුගමනය කරන කල ය. අටුවාව ද උපකාර කොටගෙන ධම්මපද ගාථා සිය බසින් පළ කළ යුරු උන් වහන්සේගේ ධර්මඥානයට ද නිදර්ශනයකි.

මෙපරිද්දෙන් කථාවස්තුව රස විඳින්නාට ධර්ම ඥානය මතු නො ව ජීවිත පරිඥානය ද තම යුතුකමට හා වගකීමට අනුගත ව ලබා දුන්න ද උන් වහන්සේ එය කිසිදු අයුරකින් නීරස ධර්මානුශාසනාවක් වීම සැම විට ම වලක්වාලූයේ නිරතුරු ව ම නො වියත් හුදී ජනයාගේ මනීෂියට සමීප වීමෙනි.

ධම්මපදට්ඨ කථාව ගුරු කොට ගැනීම හේතු කොටගෙන පාළි ඇසුර කෘතියේ සෙවණැල්ල සේ තිබීම වලක්වාලිය නුහුණයේ ය. නමුත් ධම්මපදට්ඨ කථාවේ දී පාඨකයා තමා දඹදිව පැරණි ග්‍රාමයක ජීවත් වන බැව් සිතෙයි. මන්ද එය එතරම් ම පාළි ධර්මයට අනුගත ව රචනා වී ඇති හෙයිනි. එහෙත් සද්ධර්මරත්නාවලිය රස විඳින විට  එබඳු කිසිදු පිටස්තර හැඟීමක් හදවතට නො දැනෙයි.

**'උයිත් දණ්ඩක් පතක් කපාගන්ට නිසි යකඩයක් හැරගෙන දඬුපත් බලා ඇවිදිනෝ තුඹසක් පිට සිටි කැලයක් දැක දණ්ඩක් පතක් කපන්නට වන්හ.'**

*(පටාචාරා වහන්දෑගේ වස්තුව)*

**'සියලු මාළිගාව දුම්ගෙයක් සේ විය. සිටාණන්ගේ ඇසට දුම් වැදලා කබලු මඳ හෙයින් හඬන්නා සේ ඇසින් දිය වැගිරෙන්ට වන.'**

***(මච්ඡරිය කෝසිය සිටාණන්ගේ වස්තුව)***

සද්ධර්මරත්නාවලිය රීතියෙහි විද්‍යමාන වන තවත් රචනෝපක්‍රමයක් නම් ප්‍රධාන වැකිය අතරට වර්ණනාත්මක වැකි කොටස් ඇතුළත් කිරීමයි. මුල් තැනක් නො දුන් නමුදු සද්ධර්මරත්නාවලියෙන් වර්ණනාලංකාරාදිය පූර්ණ වශයෙන් බැහැර විණැයි කිව නො හැකි, ප්‍රස්ථාව ලද සැණින් තීව්‍ර අන්දමින් සිදු කෙරුණු වර්ණනා හරහා පාඨක මනස තුළ භාව පථය ප්‍රසාරණය කරමින් පංචේන්ද්‍රිය ගෝචර සංවේදන නිර්මාණය විය. අනවශ්‍ය ලෙස වදන් භාවිතයට ඉඩ නො ගත් ධර්මසේන හිමියන් උපයුක්ත කොටගත්තේ ස්ථානෝචිත යෙදුම් ම පමණි.

ධර්මසේන හිමියන් ත්‍රිපිටකයෙහි කෙළ පැමිණියකු වතුදු නො වියත් හුදී ජනයා ඉදිරියේ පාණ්ඩිත්‍යය දිගහැර ඔවුන් වෙහෙස කරවීමට උන්වහන්සේ තුළ ආශාවක් නො තිබුණි. වඩා නිහතමානී වූ උන් වහන්සේ අරමුණු කළේ පාඨක, ශ්‍රාවක දෙපිරිසට ම මූලික වූ වුවමනා හා බලාපොරොත්තුවලට සාධාරණයක් ඉටු කිරීම යි.

සිනහ රසයෙන් යුතු රසවත් කතා ඇසීමට ගැමියන් වඩා කැමති බව දත් ධර්මසේන හිමියන් ඉඩ ලද සැම විටක ම අව්‍යාජ හාස්‍ය රසය කථාවට ඇතුළත් කළහ. බොළඳ මිනිසුන්ගේ

සිත් ඇතැම් විට ක්‍රියා කරන'යුරු උපහාසය මුසු ව කථාවට නැඟුණ ද ඒවා ගතානුගතික බැමිවලින් වෙළුණු ධර්මදේශකයන්ගේ මෙන් කර්කශ නො වන වග දත යුතු යඃ

**'සිටාණන්ගේ ඇසට දුම් වැදලා කබලු මඳ හෙයින් හඬන්නාසේ ඇසින් දිය වැගිරෙන්ට වන'**

*(මච්ඡරිය කෝසිය සිටාණන්ගේ වස්තුව)*

සද්ධර්මරත්නාවලිකරුවාණන්ගේ කථා කලාවේ වැදගත් ම අංගයක් වන්නේ සංවාද භාවිතයෙන් කතා ආකෘතිය හැඩ ගැන්වීම යි. දඹදෙණි යුගයේ අකුරු නො දත් සාහිතකාමී ගැමියන් සාහිත්‍ය රසය අත්වින්දේ උගත් පණ්ඩිතයකු ලවා කියවා ගැනීමෙනි. සංවාද ඔස්සේ කියවන්නට ශබ්ද නගා වඩා රසවත් අන්දමින් කථාවස්තුව ඉදිරිපත් කිරීමට හැකි වූ අතර ශ්‍රාවකයන් තුළ ඒකීය ධාරණාව නිරායාසයෙන් ම ඇති විය. ඊටත් වඩා වර්තමාන පාඨකයාට වෙහෙසක් ඇති නො වන පරිද්දෙන් ගැඹුරු ධර්ම කරුණු සරල ව වටහා ගත හැකි වීම ප්‍රශංසනීය ය; සම්භාවනීය යඃ

සද්ධර්මරත්නාවලිය කථා වස්තු 312කින් සමන්විත වූවකි. එය දෙවැනි වන්නේ විශුද්ධි මාර්ගයට පමණි. එහෙත් සද්ධර්මරත්නාවලියේ කතා කලාව කිසිදු ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයකට දෙවැනි නො වේඃ

දඹදෙණි සාහිත්‍ය වංශකතාව තුළ කැපී පෙනෙන අති උත්කෘෂ්ට ගද්‍ය කෘතියක් ලෙස සද්ධර්මරත්නාවලිය හැඳින්වීම සාවද්‍ය නො වේ. ධර්මසේන යතීන්ද්‍රයාණන් වහන්සේ විසින් රචිත මෙකී දහම් ග්‍රන්ථය රචනා කිරීම සඳහා උන් වහන්සේ යොදාගත් ප්‍රකාශන රීතිය වනාහි ධර්මදේශනා රීතිය නැත හොත් බණකථා රීතිය යි.

සබුද්ධික පාඨකයා උදෙසා නො ව ශ්‍රාවකයා කේන්ද්‍ර කරගනිමින් ලියැවුණු මෙකී ග්‍රන්ථය තුළ කතුවර පරමාර්ථය සාධනය කරගැනීම සඳහා මෙකී ධර්ම දේශනා රීතිය ගුරු කොටගත් බැව් නො කිවමනා ය.

විදග්ධ, වියත් නො වූ සාක්ෂරතාවයෙන් මඳ, නූගත් එහෙත් ධර්මය අවබෝධ කරගෙන, කුසල් දහම් වැඩීමේ අපේක්ෂාවෙන් ඔද වැඩුණු ගැමි ජනතාව උදෙසා රචනා කරන ලද මෙකී දහම් ග්‍රන්ථය රචනා කිරීමේ දී බණකථා රීතිය ළගන්නාසුලු අයුරින් හසුරුවා තිබීම ද ඉතා වැදගත් කොට සැලකිය යුතු බව පැවසිය යුතු ම යඃ

**'ධර්මසේන ස්ථවිරයන් තරම් කථා කීමෙහි ශූරයෙක් සිංහල ග්‍රන්ථකාරයන් අතර නො වී ය. කතා කීමෙහි ශූරයක වූ ධර්මසේන ස්ථවිරයන්ගේ රීතිය, ඇතැම් විට එකල ගමකතා කීම කලාවක් මෙන් පුරුදු කළ වෘද්ධ ගැමියන් විසින් නිපදවන රීතියට බෙහෙවින් සමාන වූවකි.'**

*(සිංහල සාහිත්‍යයේ නැගීම - මාර්ටින් වික්‍රමසිංහ)*

තම සිතැගි ඉතා සරල ව ශ්‍රාවකයාට තේරුම් කිරීමට පහසු ආකාරයකට අනුගත ව ඉදිරිපත් කළ මෙකී ග්‍රන්ථය තුළ වඩා උසස් සාහිත්‍ය රසයක් ද ගැබ් ව ඇත.

ධර්ම දේශනා පවත්වන ස්වාමීන්ද්‍රයන් වහන්සේනමක් පළමු ව සිදු කරනුයේ තමා දේශනා කිරීමට බලාපොරොත්තු වන්නා වූ යම් ධර්මයක් ඇත් ද ඒ සඳහා පූර්ව කථනයක් දෙමින්, එහි තේමාව, නිමිත්ත, ප්‍රස්තුතය හෝ අදහස සරල ව හැඟවීමයි. ආරම්භය ශක්තිමත්

ව, සරල ව, ශ්‍රවණගෝචර ව ඉදිරිපත් කිරීම තුළ ම එය අවසාන වන තුරු තම සුසිල්වත් ශ්‍රාවකයන් රඳවා තබාගැනීමට පහසු වනු ඇත. රසවත් ව ධර්මය දේශනා කිරීම සහ ඒ තුළින් ඔප්නැංවෙන සදුපදේශ ශ්‍රාවක මනසට නතු කරවීමට ගත් එකී උත්සාහය ධර්මසේන හිමියන්ට ද රීතිය වූයේ ය.

එහෙයින් ම උන් වහන්සේගේ සද්ධර්මරත්නාවලී ගද්‍ය ග්‍රන්ථය තුළ එන සැම කථාවක් ම පාහේ මෙවැනි ආරම්භයක් සහිත වීම පෙන්වාදිය හැකි යඃ

**'තව ද කළ පින් ඇත්තවුන්ටත් අවසර ලත් අකුශලයාගේ වශයෙන් වන ආපද් දක්වනු නිසා පටාචාර වහන්දෑගේ වස්තුව කියමු.'**

*(පටාචාරා වහන්දෑගේ වස්තුව)*

කතුවරයාගේ මුඛ්‍යාධ්‍යාශය නො දන්නා, නො හඳුනන භාෂාවකින් රචිත ධර්මකථා පැහැදිලි ව, සරල ව අවබෝධ කර දීමෙන් සාධු සම්මත ජන සමාජයක් බිහි කරලීම යි. ඉහත ඇති ආකාරයට ආරම්භය සනිටුහන් කරන ධර්මසේන හිමියන් තවදුරටත් කථාව ඉදිරිපත් කිරීම සඳහා මෙම ධර්මදේශනා හෙවත් බණකථා රීතිය ම උපයුක්ත කොටගනී.

ධර්මදේශනාවක දී සංකීර්ණ යම් අවස්ථාවක් මැනවින් නිරූපණය කිරීම සිදු කරයි; විස්තර කිරීම සිදු කරයි. එසේ ම සද්ධර්මරත්නාවලිය තුළ ද එන අවස්ථා, සිද්ධි, ඉතා නිර්මාණාත්මක ව එමෙන් ම විස්තරාත්මක ව වර්ණනා කර ඇති බව කිව හැකි ය.

මච්ඡරිය කෝසිය සිටාණන් වහන්සේගේ වස්තුවෙහි එන දැඩි මසුරු සිතැති, ලෝභී සිටුවරයාට කබලුපු හෙවත් කැවුම් පිස කෑමට පහළ වූ දොළ පිළිබඳ ව පවසන අවස්ථාව මීට කදිම නිදසුනකි. මන්ද එය ශ්‍රාවකයාට මෙන් ම පාඨකයාට ද එක සේ, එක එල්ලේ ඒත්තු ගැන්වෙන අවස්ථාවක් ලෙස දක්වා තිබීම යි.

**'ඉක්බිත්තෙන් ඇඹෙණියෝ හැඳබඩට ගොසින් පිට පිරිමැඳ පියා 'ඇඟට නුසුව කුමක් දැ?' යි විචාළහ. 'මට කිසිත් අඑාසුවෙක් නැතැ' යි කී කල්හී 'රජ්ජුරුවන් වහන්සේගෙන් උදහසක් වූ නියා දෑ?' යි විචාරා 'එසේත් නැතැ' යි කී කල්හි 'දූදරුවන්ගෙන් හෝ ගෙයි කෙලිකොල්ලන්ගෙන් මුසුප්පු වන්ට නිස්සක් කළ නියා දෑ?' යි විචාරා 'එසේත් නැතැ' යි කී කල්හී ගෙය වැඩ කිරීමෙහි කුසීකමක් නැත්තා සේ ම විචාරීමෙහි නුකුසී ව ...'**

*(මච්ඡරිය කෝසිය සිටාණන්ගේ වස්තුව)*

එමෙන් ම ගැටලු සහිත තැන්, අවස්ථා, සිද්ධි, පරිසරයෙන් සමාජ ඥානයෙන් යොදාගත් සහ උකහා ගන්නට යෙදුණු උපමා රූපකවලට අනුව අපූර්වතම හා නවතම, රසවත් ආකාරයට අර්ථ විවරණය කිරීම තුළින් ශ්‍රාවක ජනයාගේ රසභාව උද්දීපනය කිරීමටත්, කුළු ගැන්වීමට ධර්මසේන හිමි උත්සුක වූ අයුරු පෙනේ.

බණකථා රීතියට අනුව හුදෙක් කථා ඉදිරිපත් කිරීමේ දී දේශනා කරන්නා වූ කථාවට හේතුභූත වූ අතීත කථාව සාදා පහදා දීම ද සිදු වේ. ධර්මසේන හිමියන් ද එය එසේ ම සිදු කරන සෙයකි.

**'බොහෝ දෙනා නිවන් දක්වා මුගලන් මහතෙරුන් වහන්සේ ගිය දවසත් ශක්‍ර ව ඉපද මසුරු සිටාණන් දන්පින්හී යෙදූ සැටිය දක්වන්ට ...'**

*(මච්ඡරිය කෝසිය සිටාණන්ගේ වස්තුව)*

**'ඌ වැළිත් පියුමතුරා නම් බුදුන් සමයෙහි ඒ බුදුන් එක් විනයධර මෙහෙණිණි කෙනෙකුන් උඩ ඔසවා නඳුනුයන සිටුවන්නා සේ විනයධර මෙහෙණියන්ට අගතැන් තබන්නා දැක "මමත් මුඹ වහන්සේ වැනි බුදු කෙනෙකුන් වහන්සේ සමයෙක මේ තනතුරු ලැබෙම්ව" යි පැතූ ය.'**

*(පටාචාරා වහන්දෑගේ වස්තුව)*

මෙසේ කථාව ඉදිරිපත් කරනා අතරතුර අතුරු කථා ද ඉස්මතු කරමින් පාඨක, ශ්‍රාවක අවධානය ඇද බැඳ තබා ගැනීමට ද දම්සෙන් හිමියෝ සමත් වෙති:

**'සිටුදුවණියෝ ද කුසරජු ව උපන් බෝසතුන් ප්‍රභාවතීන් නිසා නිකෘෂ්ට ලෙසින් හැසිරුණු නියාවට හුදක් පිරිමිහු ම ගෑනුන් නිසා නිකෘෂ්ට ලෙස හැසිරෙතී ....'**

මේ සියල්ල කතුවරයාගේ මුඛ්‍ය පරමාර්ථය සාධනය කරගනු වස් මහෝපකාරී වූ උපක්‍රමශීලී බණකථා රචනා ශෛලිය සේ සැලකිය හැකි ය. දහම් දෙසුමක අවසන් පරිචයේ යළි යළි මුඛ්‍ය ධර්මෝපදේශය ඉස්මතු කිරීම සිදු වේ. එවිට සියලු දේශනාවට සවන් යොමු කළ ශ්‍රාවකයාට එහි සමස්තාර්ථය අවබෝධ කරගැනීමට හැකිවනු ඇත. දම්සෙන් හිමියන් ද මෙම ලක්ෂණය ස්වකීය කෘතියට අදාළ කරගෙන ඇත.

මේ ආකාරයට බණ කථා රීතිය ආකෘතිකමය වශයෙන් ගුරු කොට ගනිමින්, භාෂාව, වචන, උපමා, පිරුළු යොදා අර්ථය හා පණිවුඩය වඩා රසවත් ව, නිර්ව්‍යාජ ව ඉදිරිපත් කිරීමට සද්ධර්මරත්නාවලී කතුවරයාණන් පෙළඹිණි. සබුද්ධික පාඨකයා නො ව, නූගත් ග්‍රාම්‍ය ජනයා ඉලක්ක කොට ගත් සද්ධර්මරත්නාවලියේ එකී පරමාර්ථය සාධනය කිරීමෙහි ලා කතුවර හිමියන් දරන ලද උත්සාහය බණකථා රීතිය වඩවඩාත් තහවුරු කිරීමකි. එම ස්ථිර සාර්ථක ලක්ෂණයට උරුමකම් කීමට උන් වහන්සේගේ තෝරාගත් බණකථා හෙවත් ධර්මදේශනා රීතිය ද අනුපමේය, අනල්ප ලෙස වැදගත් වී ඇත.

ධර්මසේන හිමියෝ සද්ධර්මරත්නාවලිය රචනා කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ නූගත් ගැමියාට සරල ව ධර්මය තේරුම් කිරීමට මඟක් සොයා ගැනීම යි.

**'නුවණ මඳ වත් කුසලච්ඡන්දය ඇති ව ධර්මාභියෝගයට උපදෙස් ලදින් බණ දූන පින්කම්හි හැසිර නිවන් සාදා ගනිත් නම් එවන් වූ සත්පුරුෂයන්ට වැඩ පිණිස සද්ධර්මරත්නාවලී නම් ප්‍රබන්ධයක් කරම් හ.'**

පතපොත කියවා අවබෝධ කරගැනීමට තරම් උගතුන් නො වූ කුසල් කිරීමට කැමති ගැමි ජනතාවට උපදෙස් සපයා දී සුචරිතයෙහි යොමු කරවා ඉන් තවතවත් කුසල් රැස් කරවා දී සංසාරයේ කෙළවර නිර්වාණය සාක්ෂාත් කරගන්නට සාමාන්‍ය ගැමි ජනයාට යොමු කරවාලීම සද්ධර්මරත්නාවලිය කෘතිය ලිවීමේ අරමුණ බව කතුහිමියෝ පෙන්වා දෙති.

සියලු ගැමියෝ නිවනෙහි ඇලුණෝ ය. ඔවුහු පිනට ළැදි වූ ය; පිනෙහි ඇලුණෝ ය. නමුදු කුශලයෙහි ප්‍රමාද වූවෝ ය. එකී ප්‍රමාදය නතර කරවා ගැමියාට උචිත ලෙස, ගැමි විඥානයට ග්‍රහණය කරවා ගත හැකි ලෙසට ලියවුණු සද්ධර්මරත්නාවලිය වූ කලි ලාංකේය ගද්‍ය සාහිත්‍යයේ සුපේෂල, ළයාර්ද්‍ර භික්ෂුනමකගේ මනුෂ්‍ය ගුණසුවඳ විහිඳුවා ලූ සාහිත්‍ය ග්‍රන්ථයකි.